1230

# ඩෙංගු මර්දනය හා කළමනාකරණය කෙරෙහි

# ජනමාධ්‍ය දායකත්වය

**අත්තනගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයට අයත් තිහාරිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයට විශේෂිතව සිදුකරන ලද පර්යේෂණාත්මක අධ්‍යයනයකි.**

**ගංගා භාගේශ්‍රී සිරිවර්ධන**

**FGS/ M/ MSSC/ 2006/ 34**

ප්‍රවේශ අංකය: 1229

වර්ග අංකය:

**කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ ජනසන්නිවේදනය පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධි පර්යේෂණය සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධයකි**

**2015**

# නිබන්ධ සාරාංශය

ඩෙංගු මර්දනය හා කළමනාකාරීත්වය කෙරෙහි ජනමාධ්‍ය දායකත්වය නමැති මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ දී ඩෙංගු රෝග මර්ධනය කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍යය කොතෙක් දුරට දායක වූයේ ද යන්න පිළිබඳ අවධානය යොමු කෙරේ. මෙහිදී සමීක්ෂිත ගැටළුව ලෙස මතු කළේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ කොතෙක් දුරට ඩෙංගු මර්දන වැඩසටහන් විකාශය කළද, ඩෙංගු මර්දන කටයුතු සම්බන්ධ කොපමණ ලිපි පළ කළද මෙම වසංගත රෝගයට ගොදුරුවන්නන්ගේ ප්‍රමාණාත්මක වෙනසක් දක්නට නොලැබීමට හේතුව කුමක්ද යන්න අධ්‍යනයට බඳුන් විය. ඩෙංගු රෝගය හඳුනා ගැනීම, ඩෙංගු රෝග ඉතිහාසය දේශීය හා විදේශීය වශයෙන් මෙන්ම ඩෙංගු රෝග ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන පාරිසරික සාධක, ඩෙංගු මර්දනය හා කළමනාකාරීත්වය, ඒ සඳහා ජනමාධ්‍ය දැක්වූ දායකත්වය මෙන්ම අත්තනගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයට අයත් තිහාරිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශයේ අහඹු ලෙස තෝරා ගත් නිවාස වෙත ප්‍රශ්නාවලියක් යොමු කරමින් ඩෙංගු රෝගය සම්බන්ධව කරන ලද දැනුම පරීක්ෂා කිරීම සම්බන්ධ අධ්‍යයනයක් මෙම නිබන්ධනය තුළ පවතී.

අධ්‍යයන විෂය පථය සඳහා සංදේශ තෝරා ගැනීමේ දී රූපවාහිනිය, ගුවන්විදුලිය හා පුවත්පත් මෙන්ම අත් පත්‍රිකා, පෝස්ටර් වැනි දේ තෝරා ගන්න ලදි. මෙහි දී ඩෙංගු වසංගත තත්වය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමටත් එම වසංගත තත්වයෙන් ජනතාව ගලවා ගැනීමටත් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ කුමන මෙහෙවරක් කළේ ද යන්න විමසා බැලීමි.  එමෙන්ම ද්විතීය දත්ත ලෙස මෙම විෂය ක්ෂේත්‍රය සම්බන්ධ ලියවී ඇති ග්‍රන්ථ, පර්යේෂණ වාර්තා සහ සඟරා ආදියත් අන්තර්ජාල පරිශීලනයත් ඩෙංගු මර්දන ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය වැනි ආයතන මගිනුත් දත්ත ලබා ගතිමි.

අප රටට දරුණු වසංගත තත්වයක් ලෙස පැමිණි ඩෙංගු වසංගත තත්වය මෙරටින් තුරන් කිරීම සඳහා රජය මගින්, ජනමාධ්‍ය මගින්, ආගමික ස්ථාන මගින් හෝ වෙනත් ස්වේච්ඡා සංවිධාන මගින් කොතෙක් උත්සහ දැරුව ද මෙහි මූලිකම වගකීම පැවරී ඇත්තේ සාමාන්‍ය ජනතාවට බව නිගමනය විය. පෞද්ගලිකව ක්‍රියා මාර්ග ගෙන මර්දනය කළ නොහැකි අවස්ථාවන්හි දී රජයේ හෝ වෙනත් අංශයක මැදිහත් වීම අවශ්‍ය වේ. නමුත් පෞද්ගලිකව පරිසරය පිරිසිඳු කිරීමේ ක්‍රියාවලීන් සිදු කොට ඩෙංගු වාහක මදුරුවන්ට බෝ විය හැකි ස්ථාන ඉවත් කිරීමට පියවර ගන්නා තෙක් මෙම උවදුර දුරු කිරීමට නොහැකි බව මාගේ නිගමනයයි. පරිසර කළමානාකරණය හා ඩෙංගු මදුරුවන් බෝවීම වලක්වා මරණ සංඛ්‍යාව අවම මට්ටමකට ගෙන එමින් මෙම වසංගතය තුරන් කිරීමට යම්තාක් දුරකට හෝ පිටුබලයක් දීම මාගේ මෙම නිබන්ධනයේ අරමුණයි.

මූල පද

1.ඩෙංගු කළමනාකරණය

2. ඩෙංගු වලක්වා ගැනීම

3. ඩෙංගු රෝගය

4. වසංගත රෝග

5. ඩෙංගු කළමනාකරණය හා ජනමාධ්‍ය

**Abstract**

In this research study on the contribution of the media for the prevention of dengue and management attention will be focused as to the role played by the media in their contribution to prevent this epidemic. Here the problem raised was of however much anti dengue programmes were broadcast through electronic and print media, However much articles on the prevention of dengue have been published, comparatively there is no significant decrease in the number of victims who succumbed to this dreaded decease and as to the reason for this situation was one aspect of our study.

Identification of the dengue disease, history of the dengue disease, environmental factors which influence expansion of the dengue disease both locally as well as foreign, prevention and management of the dengue disease, media contribution for it, were the topics on witch a questionnaire was referred some households selected at random in the public health inspector's area, Aththanagalla in the Aththanagalla MOH division. Data collected with regard to through to the survey is contained in this study report.

When selecting memoranda relating to the scope of this study television, radio, newspapers, leaflets, posters etc.. were used. I made inquiries to find out the mission carried out through the electronic and print media to conduct awareness programme to educate the public of the dread full dengue epidemic and the ways means adopted to save the general public from it. As secondary data I obtained relevant data from books, research reports and periodicals written on this subject and the also from the dengue prevention unit ministry of health and through internet

However much the government, media, religious institutions and other voluntary organizations has attempted to eradicate this dread full epidemic from our country, it was concluded that the basic duty and responsibility is cast on the general public. When people incapable of preventing this menace using their ordinary methods the intervention of government or some other sector is required. But it is my conclusion that until each and every person take action to clean their dwelling places and environment and destroy the mosquito breeding places with a sense of responsibility, it will not be possible eradicate this dengue epidemic forever

It is my objective through this project report to be of some assistance to maintain environment management for the purpose of eradicating dengue.

**Key words**

1. Dengue Management 2 . Prevention of Dengue 3. Dengue Disease

4. Epidemic Disease 5. Dengue Management and Media